**වාණිජමය නොවන අරමුණින් පස් හා බොරළු කැණීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද පරිසර චක්‍රලේඛ අංක 03/2019 ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ**

**අරමුණ**

ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා බැඳුනු කාර්යයන් හේතුවෙන් පස් හා බොරළු ඉවත් කිරීමේදී මෙන්ම ගෘහස්ථ පරිභෝජනය සඳහා ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලබාගැනීමේදී මහජනයාට මුහුණ පෑමට සිදු වී ඇති අපහසුතා ඉවත්කිරීම උක්ත චක්‍රලේඛය නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ විය. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරීවරයාගේ අවසරය මත පස් හා බොරළු ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබාදීමෙන් අපේක්ෂා කරනුයේ යම් පුද්ගලයෙකුට තම ඉඩම තුල පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමකදී ඉවත් කිරීමට සිදු වන පස් හෝ බොරළු (ගෙපලක් කැපීම, ළිඳක් කැපීම වැනි කාර්යයන් නිසා ජනිතවන) බැහැර කිරීමේදී මතුවන අපහසුතාවයන් සඳහා සහනයක් සළසා දීමේ අදහසිනි. මෙහිදී, කිසිඳු ලෙසකින් වාණිජ පරමාර්ථයකින් පස් හෝ බොරළු කැපීමක් හෝ විකිණීමක් අපේක්ෂා නොකෙරෙන බැවින් ග්‍රාම නිලධාරින් විසින් අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා රාජ්‍ය භාගය හෝ කිසිඳු ගාස්තුවක් අය නොකළ යුතුය. එමෙන්ම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී ජනිතවන පස් හෝ බොරළු ප්‍රමාණය කියුබ් 35ට වඩා වැඩි නොවන බව අපේක්ෂා කරන බැවින් යම් ඉඩමක් සඳහා අවසරපත් ලබා දිය යුතු වන්නේ කියුබ් 35ක උපරිමය දක්වා පමණි. එමෙන්ම මෙම ඉවත් කරන පස් හෝ බොරළු බැහැර කරන ස්ථානය හා යොදාගන්නා කාර්යය පිළිබඳ තොරතුරු අයදුම්කරු විසින් ග්‍රාම නිලධාරී වෙත ලබාදිය යුතු අතර, කිසිවිටෙකත් එම ඉවත් කරන පස් හෝ බොරළු කුඹුරක්, වගුරු බිමක් හෝ පරිසර සංවේදී ස්ථානයක් ගොඩකිරීමට යොදා නොගන්නා බවට ග්‍රාම නිලධාරීන් විසින් අයදුම්කරුගෙන් තහවුරුවක් ලබාගත යුතු වේ.

**03/2019 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම**

**අ) චක්‍රලේඛයේ පළමු ඡේදය -** ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා බැඳුනු කාර්යයක් හේතුවෙන් පස් හා බොරළු කියුබ් 35ක් උපරිමයකට යටත්ව ඉවත් කිරීම සඳහා තම ඉඩම පිහිටි ග්‍රාම නිලධාරීයා වෙතින් ප්‍රවාහන අවසර පත්‍රයක් ලබාගත යුතු වේ. එහිදී පහතින් සඳහන් නියමයන්ට අනුකූලව ප්‍රවාහනයට අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

I. **අයදුම්කරු :-** පස් හෝ බොරළු ඉවත් කරන ඉඩමේ නිත්‍යානුකූල හිමිකරු

II. **ප්‍රවාහනය සිදුකල හැකි ප්‍රදේශය :-** පස් හෝ බොරළු ඉවත් කරන ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ස්ථානයකට හෝ පස් හෝ බොරළු ඉවත් කරන ඉඩමට යාබද ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුල පිහිටි බැහැර කිරීමට බාධාවක් නොවන ස්ථානයකට

III. **යම් ඉඩමකින් ඉවත් කළ හැකි උපරිම පස් හෝ බොරළු ප්‍රමාණය :-** කියුබ් 35 කි.

IV. **ප්‍රවාහනය කළ හැකි උපරිම කියුබ් ප්‍රමාණය :-** එක් වරකට කියුබ් 02 ක් හෝ එයට අඩු ධාරිතාවයෙන් යුත් සුදුසු ප්‍රවාහන ක්‍රමයක් මගිනි.

V. **ප්‍රවාහනය සිදු කළ යුතු කාලය :-** පෙ.ව. 6.00 හා ප.ව. 6.00 දක්වා කාලය වේ.

VI. **ප්‍රවාහනය සඳහා අවසරපත් නිකුත් කරනු ලබන නිලධාරියා :-** තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමකදී පස් හෝ බොරළු ඉවත් කරන ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා වේ.

VII. **ගාස්තු අයකිරීම් :-** ගාස්තු අයකිරීමක් නොමැත.

VIII. **අදාළ ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයෙහි ආකෘති පත්‍රය :-** 03/2019 චක්‍ර ලේඛනයට අමුණා ඇති මේ සමග අමුණා එවා ඇති ආකෘති පත්‍රයට අනුකූලව කැණීම් හා ප්‍රවාහනය සිදුකිරීම සඳහා අවසර පත්‍රය සකස් කර ග්‍රාම නිලධාරීවරුන් වෙත ලබා දීමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතුවේ.

IX. උක්ත ප්‍රතිපාදන යටතේ යම් ඉඩමක හිමිකරුවෙකු විසින් බොරළු/පස් කැණීම් කිරීම හා ඉඩමින් පිටතට ප්‍රවාහනය කිරීම මගින් පරිසරයට හා ජන ජීවිතයට හානියක් නොවන බව ග්‍රාම

නිලධාරීවරයා විසින් පෞද්ගලික වගකීමට බැඳෙන අතර නිශ්චිත හිමිකාරීත්වයක් සහිත හිමිකරු සතු ඉඩමෙන් කියුබ් 35 ඉක්මවා පස්/ බොරළු යන ඉදිකිරීම් අමුද්‍රව්‍ය ඉවත් කිරීම සිදු නොවන බවට ඉඩම් අයත් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා වගබලා ගත යුතුය. ඒ සඳහා ඉඩම් හිමිකරුගෙන් අවශ්‍ය තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීමට ග්‍රාම නිලධාරීන් විසින් කටයුතු කලයුතුවේ.

X. මෙම චක්‍රලේඛයේ පළමු ඡේදය යටතේ වූ ප්‍රතිපාදන මත නිකුත් කරනු ලබන සෑම ප්‍රවාහනය අවසර පත්‍රයකම එක් පිටපතක් තම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යොමු කළ යුතු අතර නිකුත් කරන අවසරපත්‍රයේ පිටපතක් හා ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් තම ග්‍රාම නිලධාරි කාර්යාලයේ පවත්වා ගත ගත යුතුවේ.

XI. ඉහත පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර යොදා ගනිමින්,

i. කුඹුරක්
ii. වගුරු බිමක්
iii. රක්ෂිතයක් හෝ පරිසර සංවේදී ස්ථානයක්

ගොඩ කිරීම සඳහා යොදා නොගන්නා බවට තහවුරු කර ගැනීම අවසර පත්‍ර නිකුත් කරන ග්‍රාම නිලධාරියාගේ පූර්ණ වගකීම වේ. ඒ සඳහා පස්/බොරළු යොදා ගන්නා කාර්යය හා බැහැර කරන පස් හා බොරළු පිළිබඳව තහවුරුවක් අවසර පත්‍රය නිකුත් කිරීමට ප්‍රථම අයදුම්කරුගෙන් ලබාගත යුතුය.

**(ආ) චක්‍රලේඛයේ දෙවන ඡේදය - වාණිජ පරමාර්ථයෙන් තොරව ඉවත් කරන පස් හෝ බොරළු ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලපත්‍රය අනුව ප්‍රවාහනය කිරීම**

මූලික පරමාර්ථය වාණිජ පදනමින් බනිජ ලබා ගැනීම සඳහා සිදුකරන කැණීමක් නොවන ක්‍රියාවලියක් හේතුවෙන් ඉවත් වන පස් හෝ බොරළු යන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කියුබ් 35 දක්වා කැණීම් කර ඉවත් කිරීමට 2010/10/20 වන දින නිකුත් කරන ලද පරිසර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය අනුව ලබා දී තිබූ අනුමැතිය, 03/2019 චක්‍රලේඛය මගින් උපරිම කියුබ් 50 නොඉක්මවන ප්‍රමාණයක් ඉවත් කිරීමට හැකිවන පරිදි ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලතල පවරා ඇත. ඒ අනුව,

I. මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්වරුන්ට කාර්යාංශය විසින් මේ වන විටත් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව සිදු කරමින් පවතින ක්‍රමවේදය එලෙසම පවත්වා ගෙන යා යුතු වේ.

II. ප්‍රවාහන බල ප්‍රදේශය - ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හෝ ඉඩමට යාබද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ දක්වා පමණක් සිදු කළ යුතුය.

III. ගාස්තු අය කිරීම - කාර්යාංශය විසින් දැනටමත් දී ඇති උපදෙස් ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවිය යුතුය.

IV. ප්‍රවාහන බලපත්‍ර - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර ඇති බලපත්‍ර පොත් පමණක් භාවිතා කළ යුතුය.

V. ප්‍රවාහනය සිදු කළ යුතු කාලය - පෙ.ව. 6.00 හා ප.ව. 7.00 දක්වා කාලය වේ.

VI. ඉඩම සංවර්ධනය කිරීමකදී ජනනය වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කියුබ් 50ක් ඉක්මවා එම ඉඩමෙන් ඉවත් නොවන බවට බලපත්‍ර නිකුත් කරන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වගබලා ගත යුතුය.

VII. පස් හා බොරළු කැණීම් හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් පැන නගින පාරිසරික හා පැන නැගෙන ගැටළු නිරාකරණය කිරීම සඳහා,

(අ.) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
(ආ.) මධ්‍යම පරිසර අධිකාරිය/ පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික් වල වයඹ පළාත් පරිසර අධිකාරිය
(ඇ.) පළාත් පාලන ආයතනය

(ඇ.) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හෝ ජල සම්පත් මණ්ඩලය වෙතින් නිශ්චිත නිර්දේශ ලබා ගත යුතු ඇති අවස්ථා වලදී එම ආයතනයන්හි අධීක්ෂණයට ලක් කළ යුතුය.

VII. ඉහත පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර යොදා ගනිමින්, කුඹුරක්, වගුරු බිමක්, රක්ෂිතයක් හෝ පරිසර සංවේදී ස්ථානයක් ගොඩ කිරීම සඳහා යොදා නොගන්නා බවට තහවුරු කර ගැනීම බලපත්‍ර නිකුත් කරන ප්‍රාදේශීය ලේකම්වරයා වගකීම වේ. ඒ සඳහා පස්/බොරළු යොදා ගන්නා කාර්යය පිළිබඳව තහවුරුවක් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම ලබාගත යුතුය.

**(ඇ) චක්‍රලේඛයේ තුන්වන ඡේදය (අ) - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් බලපත්‍ර ලබා ගැනීම**

චක්‍රලේඛයේ 2වන ඡේදයේ සඳහන් පරිදි ඉවත් කරනු ලබන ඉදිකිරීම් අමුද්‍රව්‍ය අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට යාබද නොවන වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ප්‍රවාහනය සිදුවන අවස්ථාවලදී එම පස්/ බොරළු ඉවත් කරන ඉඩම පිහිටි බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉල්ලුම් පත්‍රය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව කියුබ් 200 දක්වා වූ ප්‍රමාණයකට අදාළ ප්‍රවාහන බලපත්‍ර අදාළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් ලබා ගත හැකි වේ.

**(ඈ) චක්‍රලේඛයේ තුන්වන ඡේදය (ආ) - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය වෙතින් බලපත්‍ර ලබා ගැනීම**

ඉහත (ඇ) හි සඳහන් පරිදි සංවර්ධන ව්‍යාපෘතියකදී ඉවත් වන පස් හෝ බොරළු කියුබ් ප්‍රමාණය කියුබ් 200 ඉක්මවන අවස්ථා වලදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලය වෙත අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරන ලද ඉල්ලීම් අදාළ ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරුවරයාගේ නිර්දේශය සහිතව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළ පසු ප්‍රධාන කාර්යාලය මගින් අදාළ බලපත්‍ර නිකුත් කරනු ලැබේ.